# 18

# වාක්‍ය රීති II




නාම පදයක් වාක්‍යයක දී උක්ත පදයක් හෝ අනුක්ත පදයක් හෝ ලෙස පෙනී සිටී. එම උක්ත අනුක්ත භේදය ද උක්ත ආඛ්‍යාත පදවල පුරුෂ භේදය ද වාක්‍ය යටතේ හඳුනා ගත යුතු තවත් ලක්ෂණ දෙකකි. වාක්‍යයක උක්ත පදයේ පුරුෂයට අනුව ආඛ්‍යාතය යෙදීම නිවැරදි වාක්‍ය නිර්මාණය වීම සඳහා හේතු වෙයි.



නොමිලේ බෙදා හැරීම සඳහා ය.

පාසලේ වාර්ෂික අධ්‍යාපන චාරිකාවට නියමිත දිනය එළඹෙන තෙක් **අපි** මහත් උනන්දුවෙන් බලා සිටියෙමු. ඒ දිනය උදා විය. අම්මා මා උදෙන් ම අවදි කළා ය. ඇ ගමනට අවශ්‍ය සියලු දෑ පිළියෙල කර දුන්නා ය.

බස් රථය වෙත මා පැමිණෙන විටත් පන්තියේ බොහෝ යහළුවෝ සිටිය හ. **මම** ද ඔවුන් සමග බස් රථයට නැග අසුනක වාඩි වූයෙමි. මා අසලින් ම සිටියේ කසුන් ය. **ඔහු** මගේ හොඳ ම යහළුවා ය. ඉදිරිපස හා පසුපස අසුන් දෙකෙහි සෙනිත්, තිනිල, මලිත් හා සඳෙව් අසුන් ගත්හ. ඔවුහු ද මගේ මිතුරෝ වෙති.

'සවන් දෙන්න...'

නිශාන්ත ගුරුතුමා අප ඇමතී ය.

'අප දැන් මේ ආරම්භ කරන්නේ අනුරාධපුරය බලා යන අධ්‍යාපන චාරිකාව යි. ඔබට මේ ගමනින් බොහෝ දැනුම, විනෝදය හා අත්දැකීම් රැසක් ලබා ගන්න පුළුවන්. ඒවා පන්ති කාමරයට බෙහෙවින් උපකාර වේවි. ඒ නිසා මේ ගමනින් උපරිම ප්‍රයෝජන ගැනීමට **ඔබ** සැලකිලිමත් වන්න.'

බස් රථය පණ ගැන්වී ඉදිරියට ගියේ අපේ බලාපොරොත්තු ද පණ ගන්වමිනි.

මේ ඡේදය ඇසුරෙන් වාක්‍ය නිවැරදිව ලිවීමේ දී දැන ගත යුතු තවත් ලක්ෂණ දෙකක් අපි හඳුනා ගනිමු.

## • පුරුෂ භේදය

පුරුෂ භේදය නාම පදවල මෙන් ම ක්‍රියා පදවල ද දැකිය හැකි ලක්ෂණයකි. සියලු සර්ව නාම පද උත්තම පුරුෂ, මධ්‍යම පුරුෂ, ප්‍රථම පුරුෂ, පුරුෂ, තුනින් එකකට අයත් වෙයි.

- තමා ගැන හෝ තමන් ගැන කියැවෙන නාම පද උත්තම පුරුෂ වෙයි.

**මම** ද බස් රථයට නැග අසුනක හිඳ ගත්තෙමි.
**අපි** මහත් උනන්දුවෙන් බලා සිටියෙමු

මේ වාක්‍ය දෙකෙහි මම, අපි යන පද උත්තම පුරුෂ ඒක වචන හා බහු වචනයට අයත් ය.

ඉදිරියේ සිටින විට පමණක් ඇමතීම ලබන අය හැඟවෙන නාම පද මධ්‍යම පුරුෂ වෙයි.

ඔබ සැලකිලිමත් වන්න.

මේ වැකියෙහි යෙදී ඇති 'ඔබ' යන පදය මෙන් ම පැරණි වහරෙහි යෙදී ඇති තෝ, නුඹ යන ඒක වචන නාම පද ද තොපි, නුඹලා යන බහු වචන නාම පද ද මධ්‍යම පුරුෂය නියෝජනය කරයි.

තමාත් නො වන, ඉදිරියේත් නැති සෙසු අය ගැන කියැවෙන නාම පද අයත් වන්නේ ප්‍රථම පුරුෂයට ය.

ඔහු මගේ හොඳ ම යහළුවා ය.

ඈ ගමනට අවශ්‍ය දෑ පිළියෙල කර දුන්නා ය.

ඔවුහු ද මගේ මිතුරෝ වෙති.

ඒ අනුව ඉහත වාක්‍යවල යෙදී ඇති **ඔහු**, **ඈ** යන නාම පද ප්‍රථම පුරුෂ ඒක වචනයට ද **ඔවුහු** යන පද ප්‍රථම පුරුෂ බහු වචනයට ද අයත් වෙයි.

මේ වාක්‍යවල තද කළු අකුරින් යෙදුණු පද සියලු නාම පද නියෝජනය කිරීම සඳහා යෙදෙන පද බැවින් ඒවා සර්ව නාම පද යනුවෙන් හැඳින්වෙයි. පුරුෂ තුනට අයත් එම සර්ව නාම පද පහත වගුව ආශ්‍රයෙන් හඳුනා ගන්න.

| පුරුෂය | නාම පදය (ඒක වචන) | නාම පදය (බහු වචන) |
|---|---|---|
| උත්තම පුරුෂ | මම | අපි |
| මධ්‍යම පුරුෂ | ඔබ<br>නුඹ*<br>තෝ* | ඔබ<br>නුඹලා*<br>තොපි* |
| ප්‍රථම පුරුෂ | ඔහු<br>ඈ | ඔවුහු |

*පැරණි වහරේ යෙදී ඇත.

ප්‍රථම පුරුෂ ඒක වචනයට අයත් ඔහු, ඈ වෙනුවට මිනිසා, ගැහැනිය ආදි වෙනත් නාම පද ද ප්‍රථම පුරුෂ ක්‍රියා පද සමග යෙදිය හැකි ය.

පහත දී ඇති වගුව ඇසුරෙන් අවසාන ක්‍රියා පද ද පුරුෂ තුනට ඇතුළත් වන අයුරු හඳුනා ගත හැකි ය.



නොමිලේ බෙදා හැරීම සඳහා ය.

| අවසාන ක්‍රියා පද | | | | |
|---|---|---|---|---|
| | අනතීත කාලය | | අතීත කාලය | |
| පුරුෂය | ඒක වචන | බහු වචන | ඒක වචන | බහු වචන |
| උත්තම පුරුෂ | නරඹමි<br>නරඹන්නෙමි | නරඹමු<br>නරඹන්නෙමු | නැරඹීමි<br>නැරඹුවෙමි | නැරඹීමු<br>නැරඹුවෙමි |
| මධ්‍යම පුරුෂ | නරඹහි<br>නරඹන්නෙහි | නරඹහු<br>නරඹන්නෙහු | නැරඹීහි<br>නැරඹුවෙහි | නැරඹීහු<br>නැරඹුවෙමු |
| ප්‍රථම පුරුෂ | නරඹයි | නරඹති | නැරඹී ය<br>නැරඹුවේ ය<br>නැරඹුවා ය | නැරඹූහ<br>නැරඹුවෝ ය |

මම, අපි, ඔබ, නුඹලා, ඔහු, ඇ, ඔවුහු ආදි උක්ත පදවලට අනුව ක්‍රියා පදය වෙනස් වන බව ඉහත වගුවලින් හඳුනා ගත හැකි ය.

## ලිඛිත අභ්‍යාස

1. **ඉහත වගු දෙකෙහි එක් එක් අංක යටතේ ඇති නාම පද හා ක්‍රියා පද ගළපමින් හිස්තැනට ගැළපෙන ක්‍රියා පද යොදන්න.**

   i. මම ප්‍රදර්ශනය ........................ ii. අපි ප්‍රදර්ශනය ...........................
   iii. ඔබ ප්‍රදර්ශනය ........................ iv. නුඹලා ප්‍රදර්ශනය ...........................
   v. ඔහු ප්‍රදර්ශනය ........................ vi. ඇ ප්‍රදර්ශනය ...........................
   vii. මිතුරා ප්‍රදර්ශනය .................... viii. ඔවුහු ප්‍රදර්ශනය ...........................

2. **පහත දී ඇති වාක්‍යවල හිස්තැනට සුදුසු ක්‍රියා පදය වරහන් තුළින් තෝරා ලියන්න.**

   i. අපි පොත් ........................... (කියවමි/කියවමු).
   ii. මිනිස්සු කුඹුර ........................... (වපුරහු/වපුරති).
   iii. ළමයි සෙල්ලම් ........................... (කරති/කරයි).
   iv. ඇ ගීයක් ........................... (ගැයුවේ ය/ගැයුවා ය).
   v. ඔවුහු තරගයෙන් ජය ........................... ලැබීමු/ලැබූහ).
   vi. මිතුරෝ මට උදවු ........................... (කරමු/කරති).
   vii. අම්මා ආහාර ........................... (පිසුවා ය/පිසිති).
   viii. ඔබ දක්ෂයෙක් ........................... (වන්නෙහි/වන්නේ ය).

# උක්ත - අනුක්ත භේදය

උක්තය, කර්මය හා ක්‍රියා පදය යනුවෙන් වාක්‍යයක ප්‍රධාන අංග තුනකි.

**මිනිස්සු සතුන් ඇති කරති.**

මේ වාක්‍යයෙහි අවසාන ක්‍රියාව 'ඇති කරති' යන පදය යි. එයින් කියවෙන පදය 'මිනිස්සු' ය. එබැවින් 'මිනිස්සු' යන පදය උක්ත වී ඇත. මෙහි 'සතුන්' යන පදය 'කර්මය' යනුවෙන් හැඳින්වේ. මේ වාක්‍යයට අයත් පද තුන මෙසේ හඳුනා ගත හැකි ය.

උක්ත පදය - මිනිස්සු
ක්‍රියා පදය - ඇති කරති
කර්ම පදය - සතුන්

උක්ත පදයෙන් ක්‍රියාව කරන්නා හෙවත් කර්තෘ කියවෙන බැවින් මේ වාක්‍යය කර්තෘ කාරක වාක්‍යයකි. කර්ම පදය ක්‍රියාවෙන් නො කියවෙයි. ඒ පදය අනුක්ත පදය යි.

වාක්‍ය නිර්මාණයේ දී නාම පදයක උක්ත - අනුක්ත භේදය හඳුනා ගැනීම බෙහෙවින් වැදගත් වෙයි. මේ ඒ සඳහා නිදසුන් කීපයකි.

1 ක්‍රමය - **සර්ව නාම පද**

| උක්ත පදය | අනුක්ත පදය | උක්ත පදය | අනුක්ත පදය |
|---|---|---|---|
| මම | මා | ඔහු | ඔහු |
| අපි | අප | ඕ/ඈ/ඇය | ඈ/ඇය |
| ඔබ | ඔබ | ඔවුහු | ඔවුන් |
| තොපි | තොප | මොවුහු | මොවුන් |


නොමිලේ බෙදා හැරීම සඳහා ය.

## 2 ක්‍රමය - ප්‍රාණවාචි බහු වචන නාම පද

| උක්ත පදය | අනුක්ත පදය | උක්ත පදය | අනුක්ත පදය |
|---|---|---|---|
| ශිෂ්‍යයෝ | ශිෂ්‍යයන් | ශිෂ්‍යාවෝ | ශිෂ්‍යාවන් |
| පුත්තු | පුතුන් | මිතුරෝ | මිතුරන් |
| ගොවියෝ | ගොවියන් | ලේන්නු | ලේනුන් |
| බල්ලෝ | බල්ලන් | විද්‍යාඥයෝ | විද්‍යාඥයන් |
| ගැහැනු | ගැහැනුන් | තරුණියෝ | තරුණියන් |
| මැණියෝ | මැණියන් | තෙරණුවෝ | තෙරණුවන් |

## 3 ක්‍රමය - අනියමාර්ථ නාම පද

| උක්ත පදය | අනුක්ත පදය | උක්ත පදය | අනුක්ත පදය |
|---|---|---|---|
| මිනිසෙක් | මිනිසකු | ගැහැනියක් | ගැහැනියක |
| ඇතෙක් | ඇතකු | ශිෂ්‍යාවක් | ශිෂ්‍යාවක |
| සිසුවෙක් | සිසුවකු | ලේඛිකාවක් | ලේඛිකාවක |
| වවුලෙක් | වවුලකු | කතක් | කතක |

1, 2, 3 යටතේ දී ඇති සර්ව නාම පදවල ප්‍රාණවාචි බහු වචන නාම පදවල හා අනියමාර්ථ නාම පදවල උක්ත - අනුක්ත රූප භේදයෙහි පැහැදිලි වෙනසක් ඇති බව හඳුනා ගත හැකි ය.

පහත දැක්වෙන වැකි ඇසුරෙන් එය තවදුරටත් තහවුරු කර ගන්න. එක් එක් වාක්‍යයේ යටින් ඉරි ඇඳි පදය උක්තයක් ද අනුක්තයක් ද යන බව වරහන් තුළ දැක්වේ.

1. අපි ඔවුන් හඳුනමු (උක්ත පද)
   ගුරුතුමිය අප කැඳවූවා ය. (අනුක්ත පද)

2. මිතුරෝ අපට උදවු කළහ. (උක්ත පද)
   ඔබ යහපත් මිතුරන් ඇසුරු කරන්න. (අනුක්ත පද)

3. ශිෂ්‍යාවෝ රංගනයක් ඉදිරිපත් කරති. (උක්ත පද)
   විදුහල්පතිතුමිය ශිෂ්‍යාවන් අමතන්නී ය. (අනුක්ත පද)

4. <u>මුවෙක්</u> දිය සොයා වැවට පැමිණියේ ය. (උක්ත පද)

කොටියා <u>මුවකු</u> දුටුවේ ය. (අනුක්ත පද)

5. <u>දැරියක්</u> ගීතය ගායනා කළා ය. (උක්ත පද)

මව කුඩා <u>දැරියක</u> වඩා ගත්තා ය. (අනුක්ත පද)

## ලිඛිත අභ්‍යාස

**1. හිස්තැනට සුදුසු උක්ත පද හෝ අනුක්ත පද හෝ යොදන්න.**

| උක්ත පදය | අනුක්ත පදය | උක්ත පදය | අනුක්ත පදය |
|---|---|---|---|
| ගවයෝ | ........................ | ........................ | දක්ෂයන් |
| ........................ | පිඹුරන් | ගුරුවරු | ........................ |
| ශිෂ්‍යාවක් | ........................ | ........................ | ක්‍රීඩකයන් |
| ........................ | කුරුල්ලන් | ........................ | හෙදියන් |
| ලේඛිකාවෝ | ........................ | ළමයෙක් | ........................ |

**2. පහත සඳහන් වාක්‍යවල හිස්තැනට සුදුසු උක්ත පද හෝ අනුක්ත පදය හෝ වරහනින් තෝරා ලියන්න.**

i. කිරිල්ලියෝ ........................... රකිති. (පැටවු/පැටවුන්)
ii. ........................... පෙරහැරේ යති. (ඇත්තු/ඇතුන්)
iii. ........................... මල් පැණි බොති. (සමනලයන්/සමනලයෝ)
iv. බැතිමත්හු ........................... පුදති. (දෙවියන්/දෙවියෝ)
v. අපි ........................... දුටුවෙමු. (සිංහයකු/සිංහයෙක්)
vi. ........................... රසිකයන් පිනවති. (ගායකයන්/ගායකයෝ)
vii. මම ........................... ප්‍රිය කරමි. (මිතුරෝ/මිතුරන්)
viii. ........................... ගුරුවරුන් හමු වූහ. (සිසුහු/සිසුන්)
ix. ........................... බඩු විකුණති. (වෙළෙන්දෝ/වෙළෙන්දන්)
x. ඔවුහු ........................... දුටුවෝ ය. (අපි/අප)



නොමිලේ බෙදා හැරීම සඳහා ය.